**මධ්‍යම පරිසර අධිකාරිය - 2018**
**------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මධ්‍යම පරිසර අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට පටහැනිව වාර්තාකරණ දිනෙන් පසුව මාස 12ක් තුළදී උපලබ්ධි වීමට නියමිත වටිනාකම රු.9,960,000 ක් වූ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | භාණ්ඩාගර බිල්පත් උපලබ්ධි කිරීමට අපේක්ෂා නොකරන බැවින් ජංගම නොවන වත්කම් ලෙස දක්වා ඇත. | වර්ෂයක කාලයක් සඳහා ආයෝජනය කර ඇති බැවින් ජංගම වත්කම් ලෙස දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිළිසරු ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.1,708,236 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග රු.20,173,651 ක් ජංගම | මාර්ගස්ථ තොග ජංගම වත්කම් නොවන බැවින් නිවැරදිව ගිණුම්ගත කර ඇත. | ජංගම වත්කම් ස්වරූපයේ ගණුදෙනු බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොවන වත්කම් ලෙස දක්වා තිබුණු අතර කෙරීගෙන යන වැඩ හා මාර්ගස්ථ තොග සඳහා 2019 වර්ෂයේ ගෙවන ලද රු.1,549,579 ක් සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු ලෙස දක්වා තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ බිම් පිරවුම් හා කොම්පෝස්ට් ආදායම පිළිවෙලින් රු.7,261,920 ක් අඩුවෙන් හා රු.8,432,981 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ගීකරණ දෝෂයක් සිදු වී ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු යුතුය. |
| (ඈ) | 2006 – 2008 කාලය සඳහා වූ හිඟ සේවක අර්ථසාධක දායක මුදල් ගෙවීම සඳහා අධිකාරිය මගින් රු.මිලියන15.5 ක මුදලක් ඇස්තමේන්තු කර තිබූ නමුත් එම ගෙවිය යුතු මුදල පිළිබඳව ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කරන බව පෙන්වා දෙමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | විද්‍යුත් තැපැල් සේවය සඳහා වාර්ෂිකව දරා තිබුණු රු.2,422,437 ක් වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2019 වර්ෂයේදී ගිණුම්ගත කිරීම් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අයත් මුළු පිරිවැය රු.5,014,503 ක් වූ ඔක්සිජන් සිලින්ඩර් රෙගුලේටර් 03 ක් සවිකළ වාහනය අධිකාරියේ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. මෙම වාහනයට අදාල රු.4,642,740 ක් වූ ක්ෂය අධිකාරියේ වියදම් ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී ගිණුම්ගත කිරීම් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අනුව 2019 වර්ෂයේ රු.1,021,249 කට | ගණනය කිරීමේ දෝෂයකි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණක 04 ක් , ඩෙස්ක්ටොප් පරිගණක 04 ක් සහ යූපීඑස් 04 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 2019 වර්ෂයේදී ගෙවා තිබුණු ඉහත මුදල සාවද්‍ය ලෙස මුදල් ගෙවීමක් නොකර බැංකු ශේෂයෙන් අඩුකර දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ බැංකු ශේෂයද ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ඌ) | පිළිසරු ව්‍යාපෘතියට අදාල රු.1,322,307 ක වෙනත් ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණු අතර වටිනාකම රු.2,468,566 ක් වූ ගෙවිය යුතු වියදම් උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතීය මගින් මිලට ගෙන තිබුණු රු. 1,434,630 ක් වූ කසල බඳුන් කට්ටල 97 ක් ඉතිරි තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2019 වර්ෂයේදී ගණනය කිරීම් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | සේවයේ නියුතු නිළධාරීන් වෙත පවරා දෙන ලද පිරිවැය රු.903,939 ක් වූ මෝටර් බයිසිකල් වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | 2019 වර්ෂයේදී ගණනය කිරීම් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | පනතේ බලතල අනුව ඉටුකළ යුතු පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සම්බන්ධව අධිකාරියේ අවධානය යොමුවී නොතිබුණි.<br><br>i. අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම.<br><br>ii. කසළ, පිළිසකර නොකළ මල හා විෂ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම වැලැක්වීම.<br><br>iii. අපද්‍රව්‍ය කළමනාකරණ තුළින් ඇතිවන අතුරු ඵලයක් වන කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය තුළින් රසායනික පොහොර භාවිතය අවම කිරීම පිළිබඳව ප්‍රමුඛතාවය ලබාදීම.<br><br>iv. නාගරික කසල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා නියාමනය.<br><br>v. පොදු ප්‍රවාහන පද්ධතීන් ක්‍රියාත්මක කිරීමේදී ඇති පාරිසරික බලපෑම් නියාමනය කිරීම. | පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | පනත අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | vi. පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | | |
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | දිවයින පුරා පවතින විදුලි සංදේශන, ගුවන් විදුලි හා රූපවාහිනි සේවා සඳහා පහසුකම් සපයන සම්ප්‍රේෂණ කුළුණු සංඛ්‍යාව 9291 ක් වුවද බලපත්‍ර ලබාගෙන ක්‍රියාත්මක වන කුළුණු සංඛ්‍යාව 3,561 ක් විය. ඉන් කුළුණු 5,730 ක් සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 62 ක් විය. | මාස 06 ක කාලයක් තුළ අවශ්‍ය පියවර ගනු ලැබේ. | අවශ්‍ය පියවර කඩිනම් කළ යුතුය. |
| (ඇ) | 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | වෛද්‍ය රසායනාගාර වාර්තා හා පර්යේෂණ මධ්‍යස්ථානද ඇතුළුව සෞඛ්‍ය සේවා ආයතනවලින් ජනනය වන ජෛව වෛද්‍ය හා සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය බැහැරලීම සිදුකරන ආයතන අපද්‍රව්‍ය කළමනාකරණ සඳහා වූ බලපත්‍ර ගත යුතු වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහල් 613 කින් බලපත්‍ර ලබාගෙන තිබුණේ රෝහල් 60 ක් පමණි. | නීතිමය කටයුතු සිදුකරනු ලබන බව දන්වා සිටිමි. | නීතිමය කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය. | 2015, 2016 හා 2017 වර්ෂවල අදාල වාර්ෂික වාර්තා 2019 අප්‍රේල් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදාල වාර්තා අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. | වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුළ සභාගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2008 නොවැම්බර් 24 දිනැති අංක ඩීඑම්එස්/ඊ/03/ජේසී ආර්/එම්එස්සීසී දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ජේඑම් 12 කාණ්ඩයට අන්තර්ගතව තිබියදී නිලධාරින් 106 දෙනෙකු සඳහා නිවැරදි වැටුප් පියවරයන්හී නොතිබීම හේතුවෙන් හිඟ වැටුප් ලෙස රු.6,376,837 ක් ගෙවා තිබුණි. | 2019 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කරන බැව් දැනුම් දෙමි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------- | | | |
| | i. මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | ලබාගත් අත්තිකාරම් අදාල කාර්යය නිම වූ විගසම පියවීමට කටයුතු කළ යුතු බව දක්වා ඇතත්, අවස්ථා 37 ක දී අත්තිකාරම් රු.633,468 ක් නිරවුල් කිරීමට මාසයකට වැඩි කාලයක් ගත වී තිබුණි. | මෙවැනි ක්‍රියාවන් අවම කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි 371 (4) | අධිකාරියේ නිලධාරීන් වෙත අවස්ථා 185 කදී රු.3,836,727 ක අත්තිකාරම් අවශ්‍යතාවය ඉක්මවා ලබා දී තිබුණි. ලබාගත් අත්තිකාරම් අදාල කාර්යයට නොයොදවා සම්පූර්ණ අග්‍රිම ආපසු පියවූ අවස්ථා 17 ක් විය. | මෙවැනි ක්‍රියාවන් අවම කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(උ) සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
--------------------

| | | | |
|---|---|---|---|
| 2019 පෙබරවාරි 12 දිනැති අංක/අමප/19/0392 /104/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | මෙම ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ කිරීම හා ව්‍යාපෘති ස්ථාන වෙනස් කිරීමට අදාලව ණය ගිවිසුම සංශෝධනය කිරීමට අනුමැතිය ලබාදී තිබුණද අදාල සංශෝධනයන් ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘති ස්ථාන වෙනස් කිරීමට අදාල සංශෝධනයන් මහා භාණ්ඩාගාරය මගින් මේ වන විට සිදුකර ඇත. | ණය ආධාර ලබාගෙන ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් බැවින් කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.44,508,000 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.17,966,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,542,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු ආදායම රු.148,216,000 ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුහුදු ජලයට හසුවීම හේතුවෙන් පිළිසරු ව්‍යාපෘතියට අයත් ධාවනයෙන් ඉවත් කර තිබූ මෝටර් රථයක් වර්ෂ 07 ක කාලයක් නිෂ්ක්‍රීයව තිබුණු අතර ව්‍යාපෘතියේ මූලික අරමුණුවලින් බැහැරව වෙනත් ක්‍රියාකාරකම් 05 ක් සඳහා රු.3,922,317 ක් වැය කර තිබුණි. | මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් ක්‍රියාත්මක වන අතර ඉදිරියේදී අරමුණුවලට අනුව කටයුතු කරන බව දක්වා ඇත. | අදාල කටයුතු කඩිනම් කළ යුතු අතර අරමුණුවලින් බැහැරව කටයුතු නොකළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බලපත්‍ර ලබානොගත් සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ නිසි පසු විපරමක් කර බලපත්‍ර ලබා ගැනීම දිරිමත් කිරීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි. | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අදාළ තොරතුරු ලබා ගැනීමෙන් පසු මෙම ක්‍රියාවලියට අනුගත විය හැකිවනු ඇත. | කඩිනමින් අනුගත විය යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ලබාදුන් රු.1,583,590 ක මුදලින් රු.1,447,890 ක් උපයෝජනය නොකර අමාත්‍යාංශයට යවා තිබුණි. | විමර්ෂණ කටයුතු රැස්වීමේදී ගත් තීරණයක් අනුව තාවකාලිකව කල් දමා ඇත. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමුවිය යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 20 කට වඩා පැරණි මෝටර් රථ 07 ක් අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණු අතර ඉකුත් වර්ෂ 05 තුළ වාහන නඩත්තු හා අළුත්වැඩියා වෙනුවෙන් පමණක් රු.5,251,782 ක් වියදම් කර තිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවති. | කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5** **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 33,536,000ක් වූ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ක්‍රියාත්මක සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015ජූනි 29 දින අවසන් කිරීමට නියමිතව තිබුණද ,2019 මැයි වන විටත් ව්‍යාපෘතියේ සැළසුම් අදියරේ කටයුතු පමණක් අවසන් කර තිබූ අතර ව්‍යාපෘති කාලසීමාව 2021 වර්ෂය දක්වා දීර්ඝ කර තිබුණි .එහෙත් අදාල ණය හා පොලිය වසර 10 ක සහන කාලයකින් පසු වාර්ෂික පොළිය සියයට 0.15ක් යටතේ වසර 40කින් ගෙවා නිමකළ යුතු අතර මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම දීර්ඝ ලෙස ප්‍රමාද වීම හේතුවෙන් ලබා ගත් ණය පියවීමේදී විශාල වශයෙන් මූල්‍යමය අවාසියක් ඇතිවීම සම්බන්ධව අධිකාරියේ අවධානය යොමුකර නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 5½ ක් ගතවී ඇතත් , බිම් පිරවුම් 04 හි ඉදි කිරීමේ කටයුතු මේ දක්වාම ආරම්භ කර නොතිබුණි. ව්‍යාපෘතියේ මූලික අරමුණුවලින් හා ක්‍රියාකාරි සැලැස්මෙන් බැහැරව මාධ්‍යවේදීන්ගේ වැඩමුළුවක් සඳහා රු.192,800 ක් වියදම් කර තිබුණි. | ව්‍යාපෘති ඇගයීම් වාර්තාව සකස් කර කැබිනට් මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එම තීරණය අනුව ඉදිරි කටයුතු කළ යුතුව ඇත. | ණය ආධාර මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බැවින් ව්‍යාපෘති කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන පිළිසරු ව්‍යාපෘතියේ 2008 සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය ප්‍රගතිය සියයට | පවතින නීති රාමුව තුළ ක්‍රියා කිරීමට නොහැකි වීමේ තත්ත්වයක් පැන නැගීම හේතුවෙන් අදාල | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත |

| | | | |
|---|---|---|---|
| | 47.29 ක් වූ අතර ඉතිරිය ශුද්ධ ප්‍රතිපදානයෙන් සියයට 52.71 ක් වී තිබුණි. 2007 දෙසැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු 08 ක් අතරින් අරමුණු 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ව්‍යාපෘතිය විසින් කොම්පෝස්ට් අංගන 139 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද අංගන 33 ක් නිමකර නොතිබුණි. ඉන් අංගන 14 ක් අක්‍රිය තත්ත්වයේද අංගන 03 ක් අතරමග නවතා දමා ද, නෛතික හේතූන්මත ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකර අංගන 02 ක් ද ඉදිකරමින් පවතින අංගන 12 ක් ද ඉදිකිරීම් කටයුතු සිදු නොවූ අංගන 02 ක් ද විය. | අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ නොහැකි විය. | යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන සැලැස්මෙහි ලැයිස්තුගත කර එම සැලැස්ම අත්පොතේ 4.2.1 හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කළ යුතු වුවද ඒ අනුව පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

**3.7 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියට අයත් නොවන ඉඩමක ඉදිකර ඇති රංදෙනිය සොබාකෙත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා රු.2,141,641 ක් සමාලෝචිත වර්ෂයේ වැය කර තිබුණද එම ඉඩම පවරා ගැනීමට හෝ ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට අදාල කටයුතු සිදුවෙමින් පවතී. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 විගණන කමිටු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වුවද එම කමිටුවේදී ගන්නා ලද තීරණයන් ක්‍රියාත්මක කිරීම මන්දගාමී අයුරින් සිදුවී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | විගණන කමිටුව විසින් ගන්නා ලද තීරණයක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

**4.2 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සෞඛ්‍ය අමාත්‍යාංශය හා අනෙකුත් සම්බන්ධිත ආයතනවල සහයෝගය ඇතිව අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් පරිසර සුරක්ෂිතතාවයන් තහවුරු කරමින් නීති රීති රෙගුලාසිවලට අනුව පවත්වා ගෙනයාම සඳහා ආයතන | පරිසර පනත යටතේ නීති ගෙනඒමට කටයුතු කරමින් පවතී. | කඩිනමින් අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මෙහෙයවීමට අධිකාරිය යුහුසුළුව කටයුතු කළ යුතු වුවද ඒ සඳහා වැඩි අවධානයක් යොමු වී නොතිබුණි. | | |
| (ආ) සෝෂා පාලනය සඳහා සීමාවන් ප්‍රසිද්ධියට පත්කර තිබුණද එම සීමාවන් ක්‍රියාත්මක වී නොතිබුණි. | සෝෂා පාලනය සඳහා අවශ්‍ය උපදෙස් ජනාධිපති ලේකම් විසින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ලබා දී ඇත. | අදාල පාලනයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීමට අදාල ඉලක්ක හා එම ඉලක්ක වෙත ලඟාවීම් මැනබැලීම සඳහා වන දර්ශකයන් හා ලඟා විය යුතු සංඛිස්ථානයන් හඳුනාගෙන තිබුණද, සමහර ක්‍රියාවලින් ගැසට් පත්‍රයේ එලකිරීම සඳහා පෙළගැස්සීම, නියමු ව්‍යාපෘති වශයෙන් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් නවතා දැමීමට තීරණය කර තිබුණි. | අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී. | තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට අදාල ඉලක්ක සම්පූර්ණ කළ යුතුය. |